# තනතුරු පුරප්පාඩු

## සී/ස. දූනාගහ

# පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය

අප සමිතියේ පුරප්පාඩුව පවතින විධායක ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු සඳහා තමා විසින් පිළියෙල කරන ලද අයදුම්පතක් මගින් අයදුම් කළ හැකිය. ඔබගේ අයදුම්පත් සියලු සහතිකවල පිටපත් සමග 2021/01/30 දිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **"සභාපති, සී/ස. දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය, දූනාගහ"** යන ලිපිනයට එවීමට කටයුතු කරන්න. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කරන්න. සමුපකාර සේවයේ නියුතු අය තම සමිතිය මගින් අයදුම්පත් එවීමට කටයුතු කළ යුතුය.

## ගණකාධිකාරී තනතුර

**(102-5 වැටුප් පරිමාණය)**

**අවශ්‍ය අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්**

1. (අ) 102-6 වැටුප් පරිමාණයේ ස්ථිර ගිණුම් සහකාර තනතුරක වසර 03 ක් හෝ 103-7 වැටුප් පරිමාණයේ ගිණුම් සහකාර තනතුරක වසර 08 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

   **හෝ**

   (ආ) පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී/ කළමනාකරණවේදී උපාධියක් ලබා තිබීම හෝ කාර්මික විද්‍යාලයක හෝ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයක උසස් තාක්ෂණික ගණකාධිකරණය ඩිප්ලෝමාව සමත්වීම සහ පිළිගත් ආයතනයක ගණකාධිකරණ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 02 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

   **හෝ**

   (ඇ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් ගණකාධිකරණ ශිල්පීය පාඨමාලාව (Chartered) අන්තර්මධ්‍යම අදියර සමත් වීම/ විධායක මට්ටම සමත් වීම හෝ ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී පාඨමාලාව (CIMA) පළමුවන අදියර (සහතික පත්‍ර) සමත්වීම හෝ ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ ගණකාධිකරණ ශිල්පීය පාඨමාලාව (AAT) අවසන් අදියර සමත්වීම සහ පිළිගත් ආයතනයක ගණකාධිකරණ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 04 ක සේවා පළපුරුද්දක් ලබාතිබීම.

   **හෝ**

   (ඈ) පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ ගණකාධිකරණය පිළිබඳව වසරක ඩිප්ලෝමාව සමත්වීම සමග ගණකාධිකරණ ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 08 ක සේවා පළපුරුද්ද ලබා තිබීම.
2. පරිගණක සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ නිපුණත්වයක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.
3. වයස් සීමාව : අවු. 25 ත් 45 ත් අතර වීම.
4. වැටුප් පරිමාණය : 34,644/= 1,050X10-1,250X10-1,400X5-64,644/= මෙම වැටුපේ ආරම්භක අවස්ථාව වන රු. 34,644/= වැටුප් පරිමාණයේ පිහිටුවා කටයුතු කරනු ඇත.

## අභ්‍යන්තර විගණක තනතුර

**(102-6 වැටුප් පරිමාණය)**

**අවශ්‍ය අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්**

1. අ.පො.ස. (උ. පෙළ) වාණිජ විෂය ධාරාවෙන් සමත්වීම සමග 103-7 වැ. ප. ගිණුම් හෝ විගණන අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

   **හෝ**

2. (අ) ගණකාධිකරණය / විගණනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සමත්වීම.

   **හෝ**

   (ආ) පිළිගත් විශ්වවිද්‍යාලයක වාණිජවේදී උපාධියක් ලබා තිබීම.

   **හෝ**

   (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ ගණකාධිකරණ ශිල්පීය පාඨමාලාව (MAAT) අවසන් අදියර සමත්වීම සහ වසර 02 ක වරලත් ගණකාධිකරණ ආයතනයක පුහුණුව.

   (ඈ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වරලත් ගණකාධිකරණ ශිල්පීය පාඨමාලාව (Chartered) අන්තර් මධ්‍යම අදියර සමත්වීම/ විධායක මට්ටම සමත්වීම සහ වසර දෙකක වරලත් ගණකාධිකරණ ආයතනයක පුහුණුව සමග ඉහත (අ) (ආ) (ඇ) (ඈ) යටතේ බඳවා ගනී නම් වසර දෙකක අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් තිබීම.

   **හෝ**

3. පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ විගණනය / ගණකාධිකරණය පිළිබඳ වසර 01 ක අධ්‍යයන කාලයක් සහිත සමුපකාර ඩිප්ලෝමාව සමත්වීම සහ වසර 05 ක කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්දක් තිබීම.
4. වයස් සීමාව : අවුරුදු 23 ත් 45 ත් අතර වීම, සමුපකාර සේවයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයට උපරිමය වයස අදාළ නොවේ.
5. වැටුප් පරිමාණය : 29,804/=950X10-1,050X10-1,250X10-62,304/= මෙම වැටුපේ ආරම්භක අවස්ථාව වන රු. 29,804/= වැටුප් පරිමාණයේ පිහිටුවා කටයුතු කරනු ඇත.

**තනතුරු දෙක සඳහාම පොදු කරුණු**

1. මෙයට අමතරව වැටුපෙන් 15% දීමනාව උපරිමය රු. 4,000/- සහ රු. 2,500/- ජීවන වියදම් දීමනාව ද හිමි වේ.
2. සේවයට බඳවා ගන්නා අය සේවක අර්ථසාධක අරමුදලට හා සමුපකාර සේවක විශ්‍රාම වැටුපට දායක විය යුතුය. සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ දායකත්වය හිමිවේ.
3. ගම්පහ දිස්ත්‍රික්කය තුළ වසර දෙකකට වැඩි ස්ථිර පදිංචියක් තිබිය යුතුය.

**සභාපති,**
**සී/ස. දූනාගහ පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය,**
**දූනාගහ.**

**දුරකථන අංක : 031-2246564, 031-2243802**
**2021.01.18**